**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** **ඇමුණුම 01**

**පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව**

# අ.පො.ස.(උ.පෙළ) විභාගයේ - 2021(2022) ප්‍රායෝගික පරීක්ෂණයේ පරීක්ෂකවරුන් තෝරා ගැනීමේ අයදුම්පත්‍රය මාර්ගගත (online) ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

01. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී ඔබ විසින් සත්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කළ හොත් දීර්ඝ කාලීනව විභාග රාජකාරි තහනමකට ලක් කිරීමට ඉඩ ඇත.

02. ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩල සඳහා අයදුම් කරන නිලධාරියකුගේ පවුලේ සාමාජිකයකු, පදිංචි නිවසේ සිටින නේවාසිකයකු උක්ත විභාගයේ එම ප්‍රායෝගික පරීක්ෂණ විෂය සඳහා පෙනී සිටින්නේ නම් එවැනි නිලධාරියකු මෙම පරීක්ෂණ මණ්ඩල සඳහා අයදුම් නොකළ යුතුයි.

03. යම් නිලධාරියකු එම ප්‍රායෝගික විෂය සඳහා ප්‍රසිද්ධ උපකාරක පන්ති පවත්වන්නේ නම් ඔහු/ඇය පරීක්ෂණ මණ්ඩලයේ තනතුරක් දැරීමට සුදුසු නොවන හෙයින් අයදුම් නොකළ යුතුයි.

04. මාර්ගගතව අයදුම් කිරීමට පහත දැක්වෙන ඕනෑම ක්‍රමයක් අනුගමනය කළ හැක.

- ✶ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය www.doenets.lk වෙත පිවිස "අපගේ සේවා" (our services) යටතේ ඇති **මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)** (online applications - school exams) මත click කිරීම මඟින්,
- ✶ විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදවුම (Mobile Application), "DoE" වෙත පිවිස **මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)** මත click කිරීම මඟින්,

අනතුරුව එහි " G.C.E.(A/L) - Application for selection of Examination for Practical Boards" තෝරා ගන්න.

05. එහි තරු (*) ලකුණින් දක්වා ඇති කොටස් අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු අතර අනෙකුත් කොටස් ද තමන්ට අදාළ වන පරිදි සම්පූර්ණ කළ යුතුය.

06. මාර්ගගත ආකාරයට අයදුම් පත්‍රයේ පළමු පිටුව සම්පූර්ණ කිරීමේදී, තම ජංගම දුරකථන අංකයට අතිරේකව ස්ථාවර දුරකථන අංකයක් හෝ එසේ නොමැති නම් අමතර ජංගම දුරකථන අංකයක් ඇතුළත් කරන්න.

07. වෙබ් පිටු අතර මාරුවීමට "Back" හෝ "Next" අයිකනය භාවිත කරන්න. එහි දෙවන පිටුවේදී ඔබ ඉල්ලා සිටින දිස්ත්‍රික්කවලට අමතරව දිවයිනේ වෙනත් ඕනෑම දිස්ත්‍රික්කය සේවය කිරීමට කැමති ද නැද්ද යන්න පිළිබඳව මනා අවබෝධයකින් යුතුව සම්පූර්ණ කරන්න.

08. අයදුම්පත්‍රයේ සියලු ම කොටස් සම්පූර්ණ කර "Submit" අයිකනය click කිරීමෙන් පසු ඔබගේ අයදුම්පත්‍රය PDF ආකාරයට බාගත (Download) කර ගත හැකි වේ. එම අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපතක් (Printout) ඔබ විසින් ලබා ගත යුතුය. "Submit" නොවීමට ප්‍රධානතම හේතුව ඔබ විසින් තරු (*) ලකුණින් දක්වා ඇති කොටස් නිසි පරිදි සම්පූර්ණ නොකිරීම නිසා විය හැකි බැවින් නැවත පෙර පිටු පරීක්ෂා කර බලන්න.

09. එම මුද්‍රිත පිටපතේ ඇතැම් කොටස් අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. අංක 13 කොටස (කාලසටහන) අත් අකුරින් සම්පූර්ණ කර ආයතන ප්‍රධානියා/විදුහල්පතිවරයා මඟින් සහතික කරවා ගත යුතුය.

10. ඔබ ප්‍රධාන හෝ සහකාර පරීක්ෂකවරයකු ලෙස මින් පෙර කටයුතු කර ඇත්නම් මුද්‍රිත පිටපතේ දකුණු පස උඩ කෙළවරේ ඇති කොටුවේ සේවය කර ඇති වසර ගණන සඳහන් කළ යුතුය.

11. නියමිත පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. අදාළ ආයතනයේ ප්‍රධානියා/විදුහල්පතිවරයා විසින් අංක 15 කොටස සම්පූර්ණ කිරීමෙන් පසු අයදුම්පත්‍ර සියල්ල එකම කවරයක බහා 2022.02.03 දිනට ප්‍රථම පහත ලිපිනයට යොමු කරන්න.

විභාග කොමසාරිස් ජනරාල්,<br>
පාසල් විභාග සංවිධාන ශාඛාව,<br>
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>
පැලවත්ත,<br>
බත්තරමුල්ල.

13. ලිපිනය ලියූ කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි "2021 අ.පො.ස.(උ.පෙළ) ප්‍රායෝගික පරීක්ෂණ " යනුවෙන් සඳහන් කරන්න.

14. ඔබ අමතර වශයෙන් උපදෙස් අවශ්‍ය වුවහොත් පහත දුරකථන අංක මගින් පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව අමත්නන.

දුරකථන අංක : 0112784208/0112784537